Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

**පළාත් මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළෙඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත සහ ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශය යටතේ ඇති පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ කම්කරු තනතුරු පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට අයදුම්පත් කැඳවීම**

පළාත් මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළෙඳ, නිවාස සහ ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය යටතේ ඇති පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ කම්කරු තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

පුරප්පාඩු සංඛ්‍යාව - 05

1. *සේවා කොන්දේසි :*

1.1 මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය. (විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට යටත් විය යුතුය.)

1.2 තෝරාගනු ලබන අපේක්ෂකයන් වර්ෂ තුනක පරිවාස කාලයකට යටත් විය යුතුය.

1.3 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද මුදල් රෙගුලාසි වලට ද, බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පටිපාටික රීති සංග්‍රහයට ද, බස්නාහිර පළාත් සභා මූල්‍ය රීති සංග්‍රහයට ද, කලින් කල බස්නාහිර පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමා විසින් පනවනු ලබන රෙගුලාසි නොහොත් නියෝගවලට ද, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කල පනවනු ලබන වෙනත් රෙගුලාසි නොහොත් නියෝගවලට ද අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු නියෝගවලට ද අනුව කටයුතු කළ යුතුය.

1.4 රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස රා.ප.ච. 01/2014 මගින් පනවන ලද විධිවිධානවලටද ඉදිරියේ දී පනවන ලද විධිවිධානවලට ද යටත් විය යුතුය.

2. *වැටුප් පරිමාණය, වයස් සීමාව :*

2.1 වාර්ෂික ඒකාබද්ධ වැටුප - (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව PL 1-2016)

2.2 වැටුප් පරිමාණය - රු. 24,250 - 250 x 10 - 270 x 10 - 300 x 10 - 330 x 12 - රු. 32,780

2.3 වයස් සීමාව - 2019.04.05 දිනට,

අවම වයස - අවුරුදු 18
උපරිම සීමාව - අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

3. *බඳවා ගැනීමේ සුදුසුකම් :*

3.1 *අධ්‍යාපන සුදුසුකම්* -

අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් ඇතුළුව විෂයන් හයක් සමත් වී තිබීම. (එක් වරකදී අවම වශයෙන් විෂයන් පහක් (05) සමත් වී තිබිය යුතුය.)

4. *වෙනත් සුදුසුකම් :*

4.1 ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.
4.2 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වර්ෂ තුනක කාලයක් බස්නාහිර පළාත තුළ අඛණ්ඩ ස්ථිර පදිංචිය සනාථ කළ යුතුය.
4.3 අයදුම්කරු යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.

* තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

4.4 බස්නාහිර පළාත තුළ ඕනෑම ප්‍රදේශය සේවය කිරීමටත්, තනතුරෙහි රාජකාරි ඉටු කිරීමටත්, ප්‍රමාණවත් ශාරීරික හා මානසික වශයෙන් යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

5. *බඳවා ගැනීමේ ක්‍රමය :*

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත කුසලතා අනුපිළිවෙල අනුව පවත්නා පුරප්පාඩු සඳහා බඳවා ගැනේ.

6. *විශේෂ කරුණු :*

අයදුම්පත් කැඳවීමේ නිවේදනයට අදාළ කරුණු හෝ මෙම නිවේදනයෙන් ආවරණය නොවන කරුණු සම්බන්ධයෙන් බස්නාහිර පළාත්, මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළෙඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වේ.

7. *අයදුම්පත් එවනු ලබන පිළිවෙල :*

අයදුම්කරුවන් විසින් මේ සමග අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක තනිපිටුව භාවිතා කරමින් පිළියෙල කල අයදුම්පත් **2019.04.05** දිනට පෙර "**ලේකම්, පළාත් මාර්ග ප්‍රවාහන අමාත්‍යාංශය, අංක 204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල**" යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාර දිය යුතුය. ඉල්ලුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි පැහැදිලිව ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතුය. අසම්පූර්ණ අයදුම්පත් හා අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පසු ලැබෙන අයදුම්පත් භාර ගනු නොලැබේ. අයදුම්පත් ලැබුණු බවක් දන්වා එවනු නොලැබේ.

8. රජයේ විදුහල්පතිවරයකු සාමදාන විනිශ්චයකරවරයකු දිවුරුම් කොමසාරිස්වරයකු නීතිඥයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරිවරයකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියකු, රු. 240,360 ක් හෝ ඊට වැඩි වාර්ෂික වැටුපක් ලබන රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නිලධාරියකු විසින් අත්සන සහතික කරනු ලැබ තිබිය යුතුය.

කේ. චම්පා එන්. පෙරේරා,
ලේකම්,
පළාත් මාර්ග හා කර්මාන්ත අමාත්‍යාංශය,
බස්නාහිර පළාත.

**ආදර්ශ අයදුම්පත**

*පළාත් මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළෙඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය යටතේ ඇති පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ කම්කරු තනතුරු පුරප්පාඩු සඳහා බඳවා ගැනීම - 2019*

| ..................................... |
|---|

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

1. I. මුලකුරු සමඟ අගට යෙදෙන නම :..........................................................................

   II. සම්පූර්ණ නම :..........................................................................

2. ජාතික හැඳුනුම්පත් අංකය :..............................................................................

3. ස්ථිර ලිපිනය හා දුරකථන අංකය :..........................................................................

   ..........................................................................

   I. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :
   (අදාල කොටුව තුළ ''✓'' ලකුණ යොදන්න.)

   කොළඹ : ☐ ගම්පහ : ☐ කළුතර : ☐

   II. 2019.04.05 දිනට අදාළ දිස්ත්‍රික්කයේ ස්ථිර පදිංචිය :

   අවු. :.......................... මාස :.......................... දින :.............................

   III. දුරකථන අංකය - පෞද්ගලික :................................. රාජකාරි :...............................

4. ස්ත්‍රී/පුරුෂ භාවය (අදාළ කොටුව තුළ ''✓'' ලකුණ යොදන්න.)

   ස්ත්‍රී : ☐ පුරුෂ : ☐

5. විවාහක/අවිවාහක බව :

   විවාහක : ☐ අවිවාහක : ☐

6. උපන් දිනය :

   I. 2019.04.05 දිනට වයස : අවු. :........................., මාස :........................, දින :.............................

   II. ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ උපතින් ද? ලියාපදිංචියෙන් ද ? :..........................................................................

7. අධ්‍යාපන සුදුසුකම් ඃ

අ.පො.ස. (සා/පෙළ) ඃ

වර්ෂය ඃ.......................... විභාග අංකය ඃ.......................... වර්ෂය ඃ........................ විභාග අංකය ඃ...............................

| *විෂයය* | *ලබා ඇති සාමාර්ථය* | *විෂයය* | *ලබා ඇති සාමාර්ථය* |
|---|---|---|---|
| 1. | | 1. | |
| 2. | | 2. | |
| 3. | | 3. | |
| 4. | | 4. | |
| 5. | | 5. | |
| 6. | | 6. | |
| 7. | | 7. | |
| 8. | | 8. | |

8. ඔබ කිසියම් සාපරාධී වරදකට උසාවියෙන් දඬුවම් ලබා තිබේ නම් ඒ පිළිබඳ විස්තර දක්වන්න. ඃ.........................................................

.................................................................................................................................................................................

9. ඉහත සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි අනුව මවිසින් සාවද්‍ය තොරතුරක් දක්වා ඇතොත් මාගේ අයදුම්පත ප්‍රතික්ෂේප කළ හැකි බවත්, තෝරා ගැනීමෙන් පසුව ඒ බැව් හෙළි වුවහොත් කිසිදු වන්දියක් නොමැතිව සේවය අවසන් කරනු ලැබීමටද යටත්වන බව ද දනිමි.

..........................................,
අයදුම්කරුගේ අත්සන.

දිනය ඃ.....................................

10. *අයදුම්කරුගේ අත්සන සනාථ කිරීම* ඃ (අනවශ්‍ය වචන කපා හරින්න.)

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ................................................................. මයා මා පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු.........................දින මා ඉදිරිපිට දී ඔහුගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

සහතික කරන අයගේ නම :..........................................................................................
අත්සන :..........................................................................................
තනතුර හා නිල මුද්‍රාව :..........................................................................................

(මෙම සහතිකය රජයේ විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතීඥයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරීවරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරිවරයෙකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු රු. 240,360 ක් හෝ ඊට වැඩි වාර්ෂික වැටුපක් ලබන රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නිලධාරියෙකු විසින් අත්සන සහතික කරනු ලැබ තිබිය යුතුය.)